# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2365/76 - 2024 ජනවාරි මස 06 වැනි සෙනසුරාදා - **2024.01.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: ATU/LND/04/DO 43.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 4-3/24/2020/HA/102.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ /පරවශතාවේ විස්තර :-

මාතර දිස්ත්‍රික්කයේ අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 314 ඩී අතුරලිය බටහිර ග්‍රාම නිලධාරි වසමේ අතුරලිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 820483හි පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම : නුගගහ පිට්ටනිය**;** ඉඩමේ විස්තරය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ වැසිකිළියක් ඇත**;** ප්‍රමාණය: හෙක්ටයාර් 0.0342

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 මාර්තු මස 13 දින පෙ. ව. 10.00ට අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024.03.06 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියලු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

නිරෝෂා එස්. ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2024 ජනවාරි මස 03 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01-0057